**කැකිරාව ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**---------------------------**

**01 . මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**
**---------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ** විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින සභාපතිවරයා වෙත යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, **මූල්‍ය** ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට කැකිරාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**----------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**-------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවේ මාර්ග නඩත්තු කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ මිලදීගෙන තිබුණු නමුත් භාවිතයට නොගත් හියුම් පයිප්ප වල වටිනාකම වූ රු.729,000 ක් වියදමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ වියදම් වැඩියෙන් හා ජංගම වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබුණු රු.100,742 ක් වූ ස්ථාවර වත්කම් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීම ගිණුම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.142,137 ක් වූ ඉතිරි පාරිභෝජ්‍ය තොග ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ජංගම වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) හිගහිටි කුලී ලැබීම් රු.27,300 ක් හිගහිටි වරිපනම් ගිණුම බැරකර තිබීම හේතුවෙන් හිග හිටි වරිපනම් එම වටිනාකමින් අඩුවෙන් හා හිගහිටි කුලී එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
------------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.20,888,410 ක් වූ කර්මාන්ත ණයගැති ශේෂය තුළ වර්ෂ 03 ක් ඉක්ම වූ රු.347,913 ක ශේෂ ඇතුලත්ව තිබුණු අතර එම මුදල් අයකර ගැනීම සඳහා පියවර ගෙන නොතිබුණි.

1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

-----------------------------------------------------

රු.4,420,124 ක් වූ ලී බඩු හා උපකරණ වලට අදාලව විස්තරාත්මක උපලේඛන සහ භෞතිකව එම වත්කම් ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

2 මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

----------------

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.19,998,377 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.22,904,154 ක් විය.

2.2 මූල්‍ය පාලනය

-----------------

සභාව සතු රු. 21,853,887 ක් වූ අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට හෝ ව්‍යාපෘති ඉටු කිරීමට හෝ භාවිතා කර නොතිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය වටිනාකම | 2017 වර්ෂයේ බිල්කල ආදායම වටිනාකම | 2017 රැස්කල ආදායම 2017.01.01 හිඟයෙන් වටිනාකම | 2017 බිල්කල මුදලින් වටිනාකම | 2017 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ආදායම වටිනාකම |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 2,335,656 | 5,197,631 | 1,043,554 | 4,379,557 | 2,110,176 |
| ව්‍යාපාර හා කර්මාන්ත බදු | - | 2,028,223 | - | 2,028,223 | - |
| දැන්වීම් පුවරු | - | 373,025 | - | 373,025 | - |
| උසාවි දඩ | 48,426,193 | 15,271,516 | - | - | 63,697,709 |
| මුද්දර ගාස්තු | 6,466,529 | 600,000 | - | - | 7,066,529 |
| වෙළඳ බලපත්‍ර ගාස්තු | - | 3,451,363 | - | 3,451,363 | - |
| පරිසර බලපත්‍ර ගාස්තු | - | 283,360 | - | 283,360 | - |
| සේවා සඳහා ගාස්තු | - | 771,393 | - | 771,393 | - |
| කඩකුලී | 288,790 | 549,860 | 180,728 | 393,175 | 264,747 |
| බදුදීම් | 1,469,889 | 5,611,146 | 128,987 | 5,611,146 | 1,340,902 |
| පොල බදු | - | 608,760 | - | 608,760 | - |
| විනෝද බදු | 693,690 | 260,674 | 9,000 | 149,885 | 795,479 |
| එකතුව | 59,680,747 | 35,006,951 | 1,362,269 | 18,049,887 | 75,275,542 |

2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය
------------------------------------

සමාලෝචිත වර්ෂය ආරම්භයේ වූ රු.59,680,746 ක හිඟ ආදායමින් රු.1,362,268 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ රැස්කරගෙන තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දින වන විට හිග ආදායම රු.75,275,543 ක් දක්වා වැඩිවී තිබුණි.

2.3.3 වරිපනම් හා බදු
------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2004 වර්ෂයේදී වරිපනම් ඒකක 4861 ක් හඳුනාගෙන වරිපනම් බදු රු.5,197,631 ක් ලෙස බිල්කර තිබුණු අතර 2004 වර්ෂයෙන් පසු දේපල තක්සේරු කර ගාස්තු යාවත්කාලීන කර නොතිබුණු බැවින් සභාවට අයකරගත හැකිව තිබූ විශාල වරිපනම් බදු ආදායමක් අහිමි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ වූ රු.2,335,656 ක් වූ හිග වරිපනම් වලින් වර්ෂය තුල රු.1,043,554 ක් පමණක් අයකරගෙන තිබුණු අතර හිග වරිපනම් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.3.4 කුලී
----

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ රු.1,758,678 ක් වූ හිග කඩකුලී හා හිග බදුකුලී ආදායමෙන් රු.309,714 ක් වර්ෂය තුළ අයකරගෙන තිබුණු අතර, ඉතිරිය අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 159 වගන්තිය අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ රු.549,860 ක් වූ බිල්කල කඩකුලී ආදායමෙන් රු.393,175 ක් රැස්කරගෙන තිබුණු අතර ගිවිසුම්වල කොන්දේසි ඇතුළත් කර නොතිබීම හේතුවෙන් ඉතිරි හිගය අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු
-------------------------------

සමාලෝචිත වර්ෂය ආරම්භයට ලැබිය යුතුව පැවති රු.48,426,193 ක් වූ උසාවි දඩ හා රු.6,466,528 ක් වූ මුද්දර ගාස්තු වලින් කිසිදු මුදලක් වර්ෂය තුළ සභාවට ලැබී නොතිබූ අතර 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුද්දර ගාස්තු රු.7,066,528 ක් හා උසාවි දඩ රු.63,697,709 ක් පළාත් සභාව විසින් රඳවා ගෙන තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය
---------------------------

3.1 කාර්යසාධනය
----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා පොදු මංමාවත් පිළිබඳ කටයුතු, විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධන යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා
-----------------
ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 වනවිටත් එකී කාරණා වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම
---------------------
සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර තිබුණද එය 2014 පෙබරවාරි 17 දිනැති 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුකූලව සකස්කර නොතිබුණි.

(ඇ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම
-------------------------------------------
සමාලෝචිත වර්ෂය තුළ ඩෙංගු මර්දනය වෙනුවෙන් වැඩසටහන් 17 ක් පැවත්වීමට සැලසුම් කර තිබුණ නමුත් වැඩසටහන් 05 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
---------------------------------
සභා බල ප්‍රදේශයේ එක්රැස්වන කැළි කසළ බල ප්‍රදේශයේ හබරණ සෙවනගම හා ඇඹුල්ගස්වැව යන ස්ථාන දෙකකට වර්ග කිරීමකින් තොරව අවිධිමත් ලෙස මුදාහරිමින් පැවතුණි.

(ඉ) පාරිසරික ගැටළු
------------------
සභාවේ රැස්වන කැළි කසළ ස්ථාන දෙකකදී අවිධිමත්ව බැහැර කිරීම නිසා විශාල පාරිසරික හානියක්ද, පොලිතීන් හා ප්ලාස්ටික් දහනය කිරීම තුළින් විශාල වායු දූෂණයක් ද, එම අපද්‍රව්‍ය ආහාරයට ගන්නා වන අලින්ගේ ජීවිතවලට අවදානමක්ද ඇති වන බව නිරීක්ෂණය විය.

(ඊ) තිරසර සංවර්ධන ඉලක්ක
----------------------------
එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යායපත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණි.

3.2 කලමනාකරණ අකාර්යක්ෂමතා
------------------------------------
පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ලියාපදිංචි නොකළ ට්‍රැක්ටර් ට්‍රේලර් දෙකක් සහ වතුර බවුසර් දෙකක් ධාවනය කරමින් පැවතුණි.

(ආ) 2017 වර්ෂයේ විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ මිලදීගෙන තිබුණු රු.1,185,177 ක් වටිනා ද්‍රව්‍ය හා උපකරණ විෂයයන් 652 ක් 2018 ජුලි 04 වනවිටත් ප්‍රතිලාභීන්ට ලබාදීමට කටයුතු කර නොතිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත කරුණු නිරික්ෂණය විය.

(අ) ඉහල පුලියන්කුලම එළ ගවමස් හල රු.106,450 කට බදු දීමට ගිවිසුම්ගත වී තිබුණද, ගිවිසුම් ප්‍රකාරව සෝ ඝාතකාගාර පහසුකම් සභාව ලබානොදීම හේතුවෙන් මස්හල පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ආ) හබරණ වැව් මාළු ලැල්ල රු.26,000 කට බදුගත් බදුකරු ව්‍යාපාරය පවත්වාගෙන නොයාම සම්බන්ධව කටයුතු නොකර රු.8,700 ක් වූ 1/3 තැන්පතුව ආදායමට ගෙන තිබුණු නමුත් මාළු ලැල්ල නැවත බදු දීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) මඩාටුගම මුහුදු මාළු ලැල්ල රු.51,600 කට බදුගත් බදුකරු මාස 03 ක් ඉක්ම ගිය පසු ව්‍යාපාරය සිදුකල නොහැකි බව දන්වමින් දේපල සභාවට ලබාදී තිබූ අතර දෙවන ලංසුකරු ද දේපල භාර ගැනීම ප්‍රතික්ෂේප කර තිබුණි. එය නැවත බදු දීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සභාව විසින් ගෙන නොතිබුණි.

(ඈ) බණ්ඩාරපොතාන එළ ගවමස් හල සඳහා සෝ ඝාතකාගාරයක් ඉදිකර නොතිබූ බැවින් රු.975,450 කට බදුගත් බදුකරු මසක කුලිය වූ රු.122,000 ක් ගෙවීමෙන් පසු ව්‍යාපාරය නැවත බාරදීම නිසා සභාවට රු.853,450 ක ආදායමක් අහිමි වී තිබුණි.

(ඉ) සභාවට අයත් කඩ කාමරයක් බදුගත් බදුකරු විසින් කඩ කාමරයට යා කර විශාල නිවසක් ඉදිකර එහි පදිංචි වී සිටින නමුත් එම නිවස ඉවත් කිරීමට සභාව පියවර ගෙන නොතිබුණි.

(ඊ) අංක 2052 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016 දෙසැම්බර් 30 දිනැති ගැසට් පත්‍රයේ පලකර තිබූ ගාස්තු ප්‍රමාණයන්ට අනුකූල නොවන ලෙස අවස්ථා 128 කදී රු.338,600 ක් අයකර ගෙන තිබුණි.

(උ) සභාව සතු හබරණ නගරයේ වූ කඩ කාමර 08 න් කඩ කාමර 05 ක් 2018 ජුලි 10 දින වන විට අතුරු බදු දී තිබුණි. බදුකරුවන්ට සභාව සතු දේපල අතුරු බදු දී විශාල ආදායමක් අයකර ගැනීමට සභාව ඉඩහැර තිබූ අතර අතුරු බදු දීම තහනම් බවට ගිවිසුම්වල කොන්දේසියක් ඇතුළත් කර නොතිබීම හේතුවෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ඇති හැකියාව අවුරා තිබුණි.

3.4 **වත්කම් කළමනාකරණය**

**---------------------------**

**3.4.1 පවරා නොගත් වත්කම්**

-------------------------

සභාව භාවිතා කරන සභාව සතු යැයි ලේඛනවල ඇතුලත් අක්කර 31 රූඩ් 2 පර්චස් 8 පමණ විශාල ඉඩම් කැබැලි 24 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4.2 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

2004 හා 2005 වර්ෂ වලදී රු.2,500,000 ක් වැය කර ඇඹුල්ගස්වැව ඉදිකර තිබුණු කසල කළමනාකරණ අංගනය හා ජීවක ටැංකි 04ක් ප්‍රයෝජනයට නොගෙන නිශ්ක්‍රීයව පැවතුණි.

3.5 ප්‍රසම්පාදනය

ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි.

4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයයන් 02 ක අයවැයගත ආදායමට සාපේක්ෂව තත්‍ය ආදායම සියයට 77 සිට සියයට 79 දක්වා වූ පරාසයක විචලතාවයන් සහ වියදම් විෂයයන් 08 ක අයවැයගත වියදමට සාපේක්ෂව තත්‍ය වියදම සියයට 10 සිට සියයට 155 දක්වා වූ පරාසයක විචලතාවයන් නිරීක්ෂණය විය.

4.2 අභ්‍යන්තර විගණනය

සභාවට වගකියනු ලබන අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර වාර්තා සකස්කර තිබුණද, ඒවායේ පිටපත් විගණකාධිපති වෙත ලබාදී නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු

2009 ජුනි 09 දිනැති DMA/2009 (i) කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති චක්‍රලේඛයට අනුව 2017 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

4.4 පිළිතුරු නොදුන් විගණන විමසුම්

2017 ඔක්තෝබර් 13 දිනැති අංක NCP/AP/F/KKPS/FA/17/05 දරන විගණන විමසුමට 2018 ජුලි වන විටත් පිළිතුරු ලැබී නොතිබුණි.

5 පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| | ------------- | ----------- |
| (අ) | ගිණුම්කරණය | අවසන් තොගය භෞතිකව ගණනය කර ගිණුම්ගත නොකිරිම. |
| (ආ) | කඩකාමර හා දේපල බදු දිම් | (i) ලිපිගොනු යාවත්කාලින නොකිරීම.<br>(ii) නැවත බදු දීමට කටයුතු නොකිරීම<br>(iii) ගිවිසුම් කඩකල කුලීකරුවන්ට නීතිමය කටයුතු නොකිරීම. |
| (ඇ) | ස්ථාවර වත්කම් | (i) ඉඩම්වල අයිතිය පවරා නොගැනීම.<br>(ii) ඉඩම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම. |
| (ඇ) | කසළ කළමනාකරණය | කසළ කළමනාකරණය නොකිරීම. |